රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2021

මගේ අංකය : F/FR/03/BRCir
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.06.07

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා ආදායම් ඇස්තමේන්තු - 2022**

රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ඇතුළත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2015 හා 2015.07.20 චක්‍රලේඛය හා එහි සංශෝධනයන් පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක "20.02.01.01" වන රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් / ගණන්දීමේ නිලධාරීන් විසින් එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳ ඇස්තමේන්තු මූ.රෙ. 85(1), (2) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් ලිපිනයට මෘදු පිටපතක්ද සහිතව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ "ප්‍රධාන මූල්‍ය නිලධාරි" වෙත ඉදිරිපත් කළ යුතු වේ.

03. ඒ අනුව, 20.02.01.01 රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතාංක යටතේ 2022 වර්ෂය සඳහා ඔබ කාර්යාලය මගින් එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳව ඇස්තමේන්තු මේ සමග අමුණා ඇති ආකෘතියට අනුව සකස්කර 2021.06.25 දින හෝ ඊට පෙර මෙම අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා,පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

(ආකෘති පත්‍ර අංක. 1)

# වසර 2022 සඳහා ආදායම් ඇස්තමේන්තු

**(i)** ව්‍යවස්ථාව/ අධිකාරිය : ආයතන සංග්‍රහය / ඉඩම් සංවර්ධන ආඥා පණත / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2021

**(ii)** ව්‍යවස්ථාපිත අධිකාරිය:- රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

**(iii)** ආදායම් අයිතමය :- රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී

**(iv)** ආදායම් සංකේතාංකය :- 20.02.01.01

| විස්තරය | ආදායම 2020 රු.මිලියන | ඇස්තමේන්තු ආදායම 2021 වර්ෂය | | | වසර 2022 සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු.මිලියන | පුරෝකථන | | 3 වන සහ 4 වන තීරු අතර වෙනස පිළිබඳව හේතු | 4 සහ 6 වන තීරු අතර වෙනස (වැඩිවීම හෝ අඩුවීමට හේතු) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූලික ඇස්තමේන්තුව රු.මිලියන | සංශෝධිත ඇස්තමේන්තුව රු.මිලියන | 2021.05.31 දිනට සත්‍ය ආදායම රු.මිලියන | | 2023 රු.මිලියන | 2024 රු.මිලියන | | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) |
| 01. නිල නිවාස<br>02. සංචාරක බංගලා / නිවාඩු නිකේතන<br>03. වාණිජ ගොඩනැගිලි/ගබඩා<br>04. වෙනත් (ආපනශාලා ඇතුලත්ව ) | | | | | | | | | |
| එකතුව | | | | | | | | | |

(9 හා 10 තීරු සඳහා වලංගු හේතූන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය.)

නිවැරදි බවට සහතික කරමි

දිනය :-

.......................................................

ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා / දිස්ත්‍රික් ලේකම්

( නිල මුද්‍රාව )